1

සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | පුරවැසි අධ්‍යාපනය | 3 | 3.අපේ සංස්කෘතිය |



සැකසුම: ගයානි විජේමාන්න

බප/හො/ගල්පාත ක.වි


# සංස්කෘතිය යනු

- සමාජයක මිනිසුන්ගේ හැසිරීම, පුරුදු, සිරිත්විරිත්, ආකල්ප, ඇබ්බැහිවීම් , විශ්වාස ආදී සියල්ල ලෙස හැඳින්විය හැකිය.

ඊ.බී. ටයිලර් පවසන ලෙස

- "දැනුම්, ඇදහිලි, කලා, නීති, සිරිත්විරිත්, ඇගයීම් හා මිනිසා විසින් සමාජයේ ජීවත්වන පුද්ගලයකු ලෙස ලබා ගන්නා වූ පුරුදු, ඇබ්බැහිකම් හා හැකියාවන්ගේ සමස්තය සංස්කෘතියයි"

# සංස්කෘතික අංග


සාහිත්‍යය
භාෂාව
ඇඳුම් පැළඳුම්
නීතිරීති හා සම්ප්‍රදායන්
ආහාර පාන
අධ්‍යාපනය
කලා ශිල්ප
දැනුම
සිරිත් විරිත්
ආගම
විශ්වාස හා ඇදහිලි
සංස්කෘතික අංග

සමාජයෙන් සමාජයට සංස්කෘතිය වෙනස් වුවද එක් සංස්කෘතියක් තවත් සංස්කෘතියකින් වෙනස් වේ. නමුත් පොදු ලක්ෂණද පවතී







උදා: අධ්‍යාපනය, සංස්කෘතිය පවරා දීම, සිරිත් විරිත්, වැඩිහිටියන්ට සැලකීම

ආහාර පාන බත් , එළවළු, පළතුරු

භාෂාව

ජීවනෝපාය මාර්ග

ජනවර්ගය

ආගම

# සංස්කෘතික විවිධත්වයට හේතු

මෙම සාධක පදනම් කරගෙන සංස්කෘතියකින් තවත් සංස්කෘතියක් වෙන්ව හඳුනා ගැනීමට හැකි වීම සංස්කෘතික අනන්‍යතාව නම් වේ.



විවිධ සංස්කෘතිවලට අයත් ලක්ෂණ හඳුනා ගෙන ඒවාට ගෞරව කිරීම මෙන්ම හෙළා නොදැකීම ඉතා වැදගත්ය. එමගින් සමාජයේ සහජීවනය, සහෝදරත්වය, සමානාත්මතාව, සමඟිය ,සාමය ඇති වේ



# ශ්‍රී ලාංකික ජන සමාජයේ සංස්කෘතික විවිධත්ව

## සෑම ආගමකටම අයත් කණ්ඩායම්වල පූජනීය ස්ථාන ලෙස

ශ්‍රී පාදස්ථානය



නල්ලූර් කෝවිල



## කතරගම දේවාලය



## මඩු පල්ලිය




## තලවිල ආනා දෙව්මැදුර



- ජනවර්ග අනුව




සිංහල



බර්ගර්



දෙමළ



මුස්ලිම්



මැලේ

# • ආගම අනුව

බෞද්ධ



ක්‍රිස්තියානි



හින්දු




ඉස්ලාම්



# • ජීවනෝපාය අනුව







- **භාෂා අනුව**








# විවිධ ජනවර්ගවලට හා ආගම්වලට අයත් උත්සව අවස්ථා



සිංහල හා හින්දු අලුත් අවුරුදු

වෙසක්

පොසොන්

ඇසළ













* තෛපොංගල්
* මහා ශිව රාත්‍රී
* දීපවාලී













* නත්තල

* පාස්කුව

* මහ සිකුරාදා





* හජ්ජි

* රාමසාන්

* මිලාදුන් නබි






# විවිධ ආගම් වලට අයත් විවාහ චාරිත්‍ර







# විවිධ ආගම් වලට අයත් අවමංගල චාරිත්‍ර










# සෑම සංස්කෘතියකටම අයත් අංග සංස්කෘතික දායාද නම් වේ













# සංස්කෘතික දායාද

**සංස්කෘතික දායාද ලෙස සිරිත් විරිත්**

**කලා ශිල්ප**

**හඳුනාගත හැකිය**


# සංස්කෘතික දායාද ආරක්ෂා කළ යුත්තේ ඇයි ??

- සංස්කෘතියක අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීමට
- අතීත උරුමයන් පිළිබඳ අභිමානය වර්ධනය කර ගැනීමට
- වෙනත් සංස්කෘතීන්ට ගෞරව කිරීමට
- බහු සංස්කෘතික සමාජයක යහපත් පුරවැසියකු වීමට


# සංස්කෘතික දායාද ආරක්ෂා කිරීමට අනුගමනය කළ හැකි දේවල්


- සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීමේ වටිනාකම පිළිබඳව සමාජය දැනුවත් කිරීම
- සංකෘතික දායාදවලට හානි කරන ක්‍රියාකාරකම්වලින් වැළකීම සහ එලෙස හානි කරන අය නම් ඔවුන් ඉන් මුදවා ගැනීමට කටයුතු කිරීම
- සංස්කෘතික දායාදවලට හානිවන අවස්ථා වේ නම් ඒ පිළිබදව අදාළ ආයතන දැනුවත් කිරීම

# බොහෝ සංස්කෘතික දායාද ලෝක උරුම නිසා අනාගත පරම්පරාවට ඒවා හිමිකර දිය යුතුය.

















AVE MARIA






www.lankapradeepa.com
www.lankapradeepa.com
Attribution-NonCommercial-NoDerivs 3.0 Unported (CC BY-NC-ND 3.0) | By Lanka Pradeepa

# පවුල මගින් සංස්කෘතිය පවරා දීම

**එක් පරම්පරාවකින් තවත් පරම්පරාවකට සංස්කෘතිය පවරා දෙනු ලබනුයේ පවුල මගිනි**

උදා:- *සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය තුළ නැකතට ලිප ගිනි මෙලවීම

*කිරි ඉතිරවීම

*ගනුදෙනු කිරීම




ළිඳත් සමග ගනුදෙනු කිරීම Siritha






- මීට අමතරව පාසල, ආගමික ස්ථාන, වැඩිහිටියන් හා අසල්වාසීන් සංස්කෘතිය පවරා දීමට දායක වන අය වේ.

බහු සංස්කෘතික ජන සමාජයක සියලුම සංස්කෘතීන්ට අයත් සංස්කෘතික දායාද, සංස්කෘතික උරුම සුරකමින් සහජීවනයෙන් කටයුතු කිරීම ජාතික අභිමානය වර්ධනය වීමට හේතු වේ

# අපි ශ්‍රී ලාංකිකයින් වෙමු





# බහු සංස්කෘතික සමාජයක් යනු

එකම රටක් තුළ

විවිධ වාර්ගික, ආගමික සහ භාෂාමය කණ්ඩායම් රාශියක් ජීවත් වන සමාජ ක්‍රමයකි

# ජාතික අනන්‍යතාව පෙන්වන සංකේත

ජාතික කොඩිය

ජාතික ගීය

රාජ්‍ය ලාංඡනය


ජාතික වෘක්ෂය

ජාතික පුෂ්පය

ජාතික පක්ෂියා

ජාතික ක්‍රීඩාව





දුටුගැමුණු රජු භාවිතා කළ කොඩිය




කෝට්ටේ රාජධානියේ ජාතික කොඩිය



1515-1597 අතර කාලයේ මහනුවර රාජධානියේ කොඩිය



ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කොඩිය මෙන්ම 1948.02.04 නිදහස් දිනයේ සිට 1951 වසර දක්වා භාවිතා කළ කොඩිය



1951-1972 දක්වා කාලයේ භාවිතා කළ අලුතෙන් කොළ, තැඹිලි තීරු එකතු කළ ජාතික කොඩිය



1972 සිට වර්තමානය දක්වා භාවිතා කරන අලුතෙන් බෝ කොළ සතර එකතු කළ ජාතික කොඩිය

ශ්‍රී වික්‍රම රාජසිංහ රජු භාවිත කළ කොඩිය ඇසුරින් නිර්මාණය කර ඇත

**1948 මාර්තු මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මහතා පත් කළ කොඩි කමිටුව නිර්දේශ මත නිර්මාණය කර ඇත.**

**සාමාජිකයින්**

*එස්. ඩබ්ලිව් ආර්. ඩී බණ්ඩාරනායක මහතා*

*සර් ජෝන් කොතලාවල*

*ජේ.ආර්. ජයවර්ධන මහතා*

*ටී. බී ජයා මහතා*

*ජී. ජී පොන්නම්බලම් මහතා*

*ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා*

1951 මාර්තු 2 දින පාර්ලිමේන්තුව විසින් මෙම කොඩිය සම්මත කරනු ලැබීය

**1951 මාර්තු 31 පැරණි පාර්ලිමේන්තුව ඉදිරිපිට ඔසවා ඇත**

**1972 දී පැරණි බෝපත් හතර ඉවත් කර වර්තමානයේ පවතින බෝපත් හතර එකතු කර ඇත**

කඩුවක් අතින් ගත් සිංහයා - නිර්භීතකම
රතුපාට පසුබිම - අභිමානය
බෝපත් සතර - ධාර්මික බව
තැඹිලි පාට තීරුව - දමිළ ජනයා
කොළ පාට තීරුව - මුස්ලිම් ජනයා



## ජාතික කොඩියේ විවිධ කොටස් වලින් නිරූපිත අදහස්

01. කහපාට සිංහයා - ජනතාවගේ විනය ගරුක බව නායකත්වය, සාධාරණත්වය, සිරිත්විරිත් වලට ගරු කිරීම හා සිංහල ජාතිය සිංහයාගෙන් පැවත එන බව කියවෙන ඉතිහාස කතාව සිහිපත් කිරීම.
02. කහ පැහැ අසිපත - ධාර්මිකවද නීත්‍යානුකූලවද යුක්ති ගරුකවද රට පාලනය කරමින් මව්බිමේ ආරක්ෂාව උදෙසා නැගී සිටීම.
03. බෝපත් සතර - මෛත්‍රී. කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණ ඇතුලු සියලු ආගම් වලට ගරු කිරීමේ උතුම් ගුණය.
04. තද රතු - ශ්‍රී ලාංකික සියලු ජනතාවගේ ජීව රුධිරය හා පුරාණ සිංහල රාජකීය ධජයේ නියෝජනය.
05. කොළ/ තැඹිලි - දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ, ජා, වතු දෙමළ යනාදී සියලු සුලු ජාතීන් නියෝජනය.
06. එක සාමාන පළලකින් යුත් කහ පටිය - ජාතික කෝඩියේ සියලු කොටස් එකට බැඳි පවති. සියලු ජාතීන් අතර එකමුතුව, සාමය, ප්‍රඥාව හා අන්‍යෝන්‍ය අව බෝධය පැහැදිලි කරයි.
07. සිංහයාගේ හිසේ කේශර හා වලිගයේ නැවුණු ඉහළ කොටස - මෙම කොටස් දෙක එක සාමාන මට්ටමේ පැවතීමෙන් පාලකයා හා රට වැසියන් අතර සාමානාත්මතාව පැවතීම හා මැදුම් පිලිවෙතට ගරු කිරීම පෙන්වයි.

# එස්.එල්.එස්. 693:1985 දරණ ශ්‍රී ලංකා ජාතික කොඩිය සඳහා වූ ප්‍රමිති පිරිවිතරෙහි ජාතික කොඩියේ ප්‍රමිතිය පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.

## ජාතික කොඩිය ඔසවනු ලබන අවස්ථා

- රාජ්‍ය උත්සව අවස්ථා
- ජාතික උත්සව
- රාජ්‍ය නායක සමුළුවල
- පාසලක හෝ  ආයතනයක වැදගත්උත්සව අවස්ථාවක
- වෙනත් විශේෂ උත්සව අවස්ථාවල

# ජාතික කොඩිය ප්‍රදර්ශනයේදී සැලකිලිමත් විය යුතු කරුණු

- පැහැදිළිව පෙනෙන ස්ථානයක ඔසවා තැබීම
- සිරස්වර්ණ තීරු දෙක කොඩි ගස දෙසින් සිටින පරිදි ඔසවා තැබීම
- සෑම උත්සවයකදීම එයට ප්‍රමුඛතාව දීම
- වෙනත් රටවල ජාතික කොඩිය සමග ඔසවා තබන විට සමාන උසකින් තැබීම / ශ්‍රී ලංකා ජාතික කොඩියට සමාන උසකින් තැබීම/ ශ්‍රී ලංකා ජාතික කොඩියට වම් පසින් තැබීම/ සෑම ජාතික කොඩියක්ම එක සමාන ප්‍රමාණයකින් යුක්ත වීම
- රාත්‍රී කාලයේදී ඔසවා තබන්නේ නම් විදුලි ආලෝකය ලැබීමට සැලැස්වීම

- සියල්ලට මැදින් තැබීම හා ඉහළම ස්ථානයේ ඔසවා තැබීම.
- එකිනෙකට ළංව ඇති කොඩි කණු කිහිපයක කොඩි එල්ලනු ලබන විට පළමුව එසවීම හා අවසානයේ පහත් කිරීම
- වීදියක් මැද ප්‍රදර්ශනය කරන විට සිංහයා පොළවට සෘජුව සිටින සේ තිරස් අතට කොඩිය දිග පැත්තෙන් එල්ලීම
- පෙරහරක ගෙන යන විට පෙළපාලියේ දකුණු පසින් ගෙන යාම හා වෙනත් කොඩි සමග ගෙන යන විට කොඩි පෙළේ මැදට ඉදිරියෙන් ගෙන යාම

# උත්සවයක ජාතික කොඩිය එසවීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු රීති

- එසවීමට පෙර යොතට සවි කර හකුලා උස් ස්ථානයක තැබීම
- කොඩිය ඔසවන්නා සීරුවෙන් සිට එසවීම හා අනෙක් සියලු දෙනා නැගිට කොඩියට මුහුණලා සීරුවෙන් සිටීම
- එසවීම හා පහත් කිරීම සෙමෙන් හ ගෞරවාන්විතව කිරීම
- ඔසවන විට හැකි සෑම අවස්ථාවකදීම මගුල් බෙර වැයීම හා ශංඛ නාද පැවැත්වීම
- ඔසවා අවසන් වී සියලු දෙනා සීරුවෙන් සිට ගැනීමෙන් පසු ජාතික ගීය ගායනා කිරීම

# ජාතික කොඩිය අඩකුඹු කිරීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු රීති

- රජය විසින් ප්‍රකාශයට පත් කර ඇති ජාතික ශෝක දිනයන්හී පමණක් අඩකුඹු කිරීම
- පළමුව කොඩිය මොහොතකට කොඩි ගසෙහි ඉහළටම ඔසවා යළි අඩකුඹු කරන ස්ථානය දක්වා පහත් කිරීම
- කොඩි ගසේ මුදුනේ සිට මුළු කොඩි ගසේ උසින් 1/3 ක් ප්‍රමාණයක් පහත් කර ගැට ගැසීම
- දවස අවසානයේ පහත් කිරීමට පෙර එය නැවත මුදුනට ඔසවා ඉන් අනතුරුව පහත හෙළීම

# අධ්‍යාපන ආයතනවල ජාතික කොඩිය ඔසවා තැබීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු රීති

- සෑම පාසල් වාරයක ආරම්භයේදී සහ වාරය තුළ සෑම මාසයකම ආරම්භයේ එසවීම
- රජය විසින් නියම කරනු ලබන විශේෂ දිනවල එසවීම
- ත්‍යාග ප්‍රදානෝත්සව, ක්‍රීඩා උත්සව ආදී විශේෂ අවස්ථාවල එසවීම

# ජාතික කොඩිය භාවිතයේදී නොකළ යුතු දේවල්

- හානි වූ, අවලක්ෂණ වූ කොඩි ප්‍රදර්ශනය කිරීම
- කිසිදු සැරසිල්ලක් ලෙස භාවිත කිරීම
- සිංහයා උඩු යටිකුරු කර ප්‍රදර්ශනය කිරීම
- පොළොව ස්පර්ශවීමට සැලැස්වීම
- අඳින ඇඳුමක් හෝ ඇතිරිල්ලක් ලෙස යොදා ගැනීම
- කිසිදු ලාංඡනයක්, පින්තූරයක්, වචනයක්, චිත්‍රයක් කොඩිය මත තැබීම
- ක්‍රීඩා ඇඳුමක් වශයෙන් පාවිච්චි කිරීම (හමුදා, ගිනි නිවන හමුදා හා පොලිස් නිලධාරීන්ගේ ඇඳුමට කොඩියේ ලාංඡනයක් තබා මසා ගනු ලැබිය හැකිය)

# ජාතික ගීය

අප රටේ ජාතික ගීය "ශ්‍රී ලංකා මාතා" වේ

මෙහි නිර්මාතෘවරයා ආනන්ද සමරකෝන් මහතාය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී.....ලංකා
නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරි බරිනී
සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක
මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැපසිරි සෙත සදනා
ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී.....ලංකා
නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා ඔබමය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති අප හද තුල භක්ති
ඔබ අප ආලෝකේ අපගේ අනු ප්‍රාණේ
ඔබ අප ජීවය වේ අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ
නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන
යනු මැන ජය භූමී කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැරලා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී.....ලංකා
නමෝ නමෝ නමෝ නමෝ මාතා

*ජාතික ගීය තුළින්,*

- *මව්බිම පිළිබඳ අභිමානයක්, ආදරයක්, ගෞරවයක් මෙන්ම භක්තියක් ඇති වේ.*
- *සමස්ත රටේ සියලුම වාර්ගික, ආගමික සහ භාෂා කතා කරන ජන කණ්ඩායම් නියෝජනය වේ*

## ජාතික ගීය ගායනා කරනු ලබන අවස්ථා

- ✓ ජාතික උත්සව
- ✓ රාජ්‍ය උත්සව
- ✓ ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායක උත්සව
- ✓ පාසල් හා වෙනත් පොදු වැදගත්කමක් ඇති උත්සව
- ✓ ශ්‍රී ලංකාව කරන නියෝජනය කරන ජාත්‍යන්තර තරග
- ✓ වෙනත් වැදගත් උත්සව

**ජාතික ගීයක් සලකා බැලීමට පත් කළ සිංහල විනිශ්චය මණ්ඩලය වූයේ,**

එස්. එල්. බී. කපුකොටුව මහතා

එල්. එල්. කේ. ගුණතුංග මහතා

ලයනල් එදිරිසිංහ මහතා

පී.බී. ඉලංගසිංහ මහතා

ආචාර්ය ඕ. එච්. ඩී. ඒ. විජයසේකර මහතා

මුදලිඳු ර්. ඒ. අබේසේකර මහතා

- මෙම තරගය පැවැත්වූයේ, 1948 ජනවාරි 31 ය.
- එම තරගයෙන් ජය ගත්තේ. පී.බී. ඉලංගසිංහ මහතා ලියූ ලයනල්එදිරිසිංහ මහතා සංගීත්වත් කළ

  " ශ්‍රී ලංකා මාතා පාලා යස මහිමා ජය ජය"
- 1948 පෙබරවාරි 04 දින මෙය ගායනා කරන ලදී.

- එහෙත් විනිශ්චය මණ්ඩලයේ දෙදෙනෙකු මෙය නිර්මාණය කර ඇති නිසා ඊට ජනතාව විරුද්ධ විය.

- දෙවන නිදහස් දිනයේදී ආනන්ද සමරකෝන් මහතා රචනා කළ,

  *"නමෝ නමෝ මාතා" ගීතය*

1951 නොවැම්බර් 22 මෙම ගීතය රටේ ජාතික ගීය විය යුතු බව තීරණය විය.


- **1961 පෙබරවාරි මස මුල් පද පේළිය, ශ්‍රී ලංකා මාතා ලෙස වෙනස් විය**

- 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන උපලේඛනයේ ශ්‍රී ලංකා ජනරජයේ ජාතික ගීය "ශ්‍රී ලංකා මාතා" ගීතය බව සඳහන් කර ඇත
- මෙහි සංශෝධනයක් කිරීමට පාර්ලිමේන්තුව විසින් සහ ජනමත විචාරනයක් මගින් අනුමත විය යුතුය

**රාජ්‍යයේ අයිතිය මෙන්ම අනන්‍යතාව සංකේතවත් කරන සංකේතය රාජ්‍ය ලාංඡනයයි**

- *අප රටේ භාවිත වන රාජ්‍ය ලාංඡනය හඳුන්වා දී ඇත්තේ 1972දීය*

- 1972 මැයි 22 ලංකාව ජනරජයක් බවට පත්වීම සැමරීමට රාජ්‍ය ලාංඡනය හඳුන්වා දී ඇත.


ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනය
වී කරල්
(සශ්‍රීක බව)
ධර්ම චක්‍රය
(දැහැමි බව)
නෙළුම් පෙති
(පවිත්‍ර බව)
සිංහයා
(එඩිතර බව)
හඳ
(සදාකාලික බව)
ඉර
(සදාකාලික බව)
පුන් කලස
(සෞභාග්‍ය බව)

# රාජ්‍ය ලාංඡනය යොදන අවස්ථා,

- ❑ *මුදල් නෝට්ටු*
- ❑ *අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ලිපි ශීර්ෂ*
- ❑ *විදේශ ගමන් බලපත්‍ර*
- ❑ *ජාතික හැඳුනුම්පත*

- රාජ්‍ය ලාංඡනයේ භාවිත අයිතිය හිමි වන්නේ ජනාධිපතිවරයාටය
- බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ අප රට භාවිත කරන ලද්දේ සිංහයා සහ කගවේනා සහිත බ්‍රිතාන්‍යය ලාංඡනයයි

නිදහස ලැබීමෙන් පසු පළා පෙති සහිත වෘත්තයක් තුළ සිංහයා සහ ඊට ඉහළින් ඔටුන්නත්, පහතින් ලංකා යන්නත් යෙදූ ලාංඡනයත් භාවිත විය

වර්තමාන රාජ්‍ය ලාංඡනය නිර්මාණය කර ඇත්තේ **එස්.එම්. සෙනවිරත්න මහතාය**



# ජාතික වෘක්ෂය





# මෙහි උද්භිද විද්‍යාත්මක නාමය:

## මෙසුවා නාගස් ආරියම්

සිංහලෙන් - නා

හින්දි - නාගශේකර

දෙමළ - නාක/ නාගචූරම්

ඉංග්‍රීසි - අයන්වුඩ්

පාලි - නාග

සංස්කෘත - නාග

**1986 පෙබරවාරි 26 දින සිට**

**මෙරට ජාතික වෘක්ෂය නා ගසයි**

# ජාතික වෘක්ෂය ලෙස නා ගස තෝරා ගැනීමට බලපෑ සාධක නම්

- ශ්‍රී ලංකාවට උරුම ශාකයක් වීම (ඒක දේශීය)
- එහි ඇති ප්‍රයෝජනවත් බව
- ඓතිහාසික හා සංස්කෘතික වැදගත්කම
- අලංකාරවත් හා පියකරු බව
- ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්තව තිබීම
- පහතරට තෙත් කලාපයේ මෙන්ම වියළි කලාපයෙහිද බහුලව වැවෙන මෙය පන්සල් හා දේවාල ආශ්‍රිතව සුලභව දැකිය හැකිය. එසේම මග දෙපස සෙවණ සඳහාද නා ගස් රෝපණය කර ඇත
- වෙනත් රටක රාජ්‍ය ලාංඡනයක් ලෙස භාවිත නොකිරීම

- පූජනීයත්වයෙන් සැලකීම උදා: මංගල, සුමන, රේවත හා සෝභිත යන බුදුවරු නා සෙවණෙහි බුද්ධත්වය ලබා ඇත
- මතු බුදු වන  මෛත්‍රීය බෝසතුන් නා ගසක් මුල බුද්ධත්වයට පත් වන බවට බෞද්ධයන් විශ්වාස කරයි
- ගෞතම බුදුන් වහන්සේගේ පළමු ලංකා ගමනයේදී මහියංගනයේ නා පැළයක් රෝපණය කළ බවට විශ්වාස කරයි
- දළු තද රෝස පැහැයක් ගනී
- මෝරා යන විට කොළ වර්ණයට හැරේ

- තද ගතියෙන් යුක්ත නා ලීය දිගු කලක් පවතී
- පන්සල් හා දේවාල ඉදි කිරීමට පමණක් එම ලී භාවිත කරයි
- අතීතයේ පාලම් හා ඒදඬු ඉදි කිරීමටත් යොදා ගෙන ඇත
- ඖෂධීය ගුණය ඉතා ඉහළය (මුල්, පොතු, මල්, රේණු, ගෙඩි, දළු, කොළ)
- නාමල් රේණු සුවඳ විලවුන් නිෂ්පාදනයටද යොදා ගනී

# ජාතික පුෂ්පය



## නිල් මානෙල් මල

උද්භිද විද්‍යාත්මක නාමය - නිම්පියා ස්ටෙලාටා

**සිංහල : මානෙල්/නිලුපුල්/න්ලුප්පල**

**දෙමළ : නීලොත්පල**

**ඉංග්‍රීසි : බ්ලූ වෝටර් ලිලී (Blue Water Lily)**

- මඩ සහිත වගුරු බිම්වල හා ජලාශවල හට ගනී
- වර්ණය තද දම් පැහැතිය
- හිරු එළිය ලැබෙන විට විකසිත වී හිරු බැස යාමත් සමඟ හැකිලී යයි

# ජාතික පුෂ්පය ලෙස භාවිතයට හේතු



- ප්‍රයෝජනවත් බව
- සංස්කෘතික වැදගත්කම
- ඓතිහාසික වැදගත්කම
- විද්‍යාත්මක වැදගත්කම
- සෞන්දර්යාත්මක වැදගත්කම
- ඒක දේශීය ශාකයක් වීම
- රටේ සෑම ප්‍රදේශයකම පහසුවෙන් වැවෙන සුළු වීම
- වෙනත් රටක ජාතික පුෂ්පයක් ලෙස භාවිත නොකිරීම

**ඉන්දියාවේ සහ බංග්ලාදේශයේ ජාතික පුෂ්පය: නෙළුම් මල**

# 1986 පෙබරවාරි 26

# නිල් මානෙල් මල මෙරට

# ජාතික පුෂ්පය විය

# නිල් මානෙල් පුෂ්පය,

- ඉන්දීවර , නිලුපුල්, නීලුප්පල යන නම් වලින් හඳුන්වා ඇත
- බුදුරදුන්ගේ ශ්‍රී පාද පත්ලෙහි පිහිටි මංගල ලක්ෂණ 108 අතර නිල් මානෙල් මල් දෙකක සලකුණු වූ බව සඳහන් නිසා මෙය සුභ ලකුණක් බව සලකයි

- සීගිරි ලලනාවන් අත නිල් මානෙල් හා නෙළුම් මල් වන බව සඳහන් වේ.
- කාන්තාවන් කර්ණාභරණ ලෙස නිල් මානෙල් පැළඳූ බව සන්දේශ කාව්‍යවල දක්වා ඇත
- කාශ්‍යප රජ සිය දියණිය මහනෙල් මලකට සමාන කර උප්පලවණ්ණා ලෙස නම් කර ඇත

- ශාකයේ අල, දඬු, මල්, රේණු, ඇට යනාදි සෑම කොටසක්ම ඖෂධීය කොටස් වේ
- පහත රට සෑම ප්‍රදේශයකම නොගැඹුරු ගංගා, ඇළදොළ, වැව් යනාදියේ හොඳින් වැඩේ.
- නිම්ෆියා කුලයට අයත් ශාක දෙකක් හෝ කීපයක් එකම ජලාශයක ඇති විට ස්වභාවිකව දෙමුහුන් වීම මෙහි දක්නට ලැබෙන සුලබ ලක්ෂණයකි.
- එමගින් නව ලක්ෂණ සහිත මල් හටගන්නා නිසා උද්‍යාන අලංකරණයේදී වැදගත් වේ.

# ජාතික පක්ෂියා



# ලක්ෂණ

- දිවයින පුරා වනාන්තරවල දැකගත හැකිය
- රංචු ලෙස ජීවත් වේ
- අනතුරක් දුටු විට ක්ෂණිකව කලබල වේ
- ආරක්ෂාව සදහා උස් ස්ථානයකට ඉගිලීම
- තම සාමාජිකයින්ට අනතුර පිළිබද දැනුවත් කිරීමට හඩ නැගීම
- ධාන්‍ය, ගෙඩි, පත්‍ර වර්ග, කුඩා කෘමි සතුන් මල් පොහොට්ටු ආදිය ආහාරයට ගනී
- හිරු පායා ඒමට ආසන්න අවස්ථාවේදී හැඬලීම
- අහිංසක මෙන්ම කඩිසර සතෙකි
- අභියෝග හමුවේ පසු නොබසී
- අන්‍යොන්‍ය සහයෝගයෙන් ක්‍රියා කිරීම

- සත්ත්වයා  හා ලාංකික ගැමි ජන ජීවිතය හා බැඳුනු සමීප සම්බන්ධතාව
- වළි කුකුළාගේ කඩිසර බව හා බාහිර පෙනුම
- ශ්‍රී ලංකාවට ආවේණික වීම
- වඳ වී යන සතෙකි (ඇල්ලීම, රඳවා තබා ගැනීම, ඝාතනය කිරීම දඬුවම් ලැබිය යුතු වරදකි)

# ජාතික ක්‍රීඩාව: වොලිබෝල්



- ලොව ප්‍රථම වරට ආරම්භ වන්නේ ක්‍රි.ව. 1885 ඇමරිකා එක්සත් ජනපදයේ හෝලියොක් නගරයේය
- ලොවට හඳුන්වා දුන්නේ විලියම්. ජේ මෝගන් මහතාය
- අප රටට එය හඳුන්වා දුන්නේ 1916 දී ඇමරිකානු ජාතික රොබට් වෝල්ටර් මහතාය

- එල්ලේ ජාතික ක්‍රීඩාව ලෙස නොගත්තේ එය ජාත්‍යන්තර ක්‍රීඩා තරග සදහා යොදා ගැනීමට තිබූ දුෂ්කරතාවය නිසාය
- සාමය, සමගිය, සහභාගීත්වය, ජය පරාජය සමසේ විඳ දරා ගැනීමේ ශක්තිය ඇති කිරීමට මෙම ක්‍රීඩාව වැදගත් වේ

# තෝරා ගැනීමට හේතු

- සාමූහිකව තරග කිරීමෙන් ජය ලබා ගැනීමට හැකියාව ලැබේ
- වැඩි පිරිසකට අඩු පහසුකම් යටතේ එකවර ක්‍රීඩා කළ හැකිය
- ලංකාව පුරා ව්‍යාප්ත ජනප්‍රිය ක්‍රීඩාවකි

# තම සංස්කෘතික අනන්‍යතාව හඳුනා ගැනීම

කිසියම් ජන වර්ගයකට , ආගමික කණ්ඩායමකට , ජන සමූහයකට පාරම්පරිකව උරුම වී ඇති සංස්කෘතික අංග තම සංස්කෘතික අනන්‍යතාව නම් වේ

උදා: සිංහල බෞද්ධයන් වැඩිහිටියන් හා සම අසුන්වල ඉඳ නොගැනීම

අප සංස්කෘතික අංග ආරක්ෂා කරන ලෙසම අන් සංස්කෘතීන්ගේ අංග ආරක්ෂා කිරීමද , අන්‍යෝන්‍ය විශ්වාසය, ගරුත්වය, සහ සහජීවනය ඇති වීමට හේතු වේ



# සාරධර්ම

සාරධර්ම යනු...

පුද්ගල ජීවිතය හා සමාජ ජීවිතය අර්ථවත් කරන, සදාචාරාත්මක හා සංස්කෘතික වටිනාකමක් ඇති යහපත් සමාජයක පැවැත්මට අදාළ මානව ගුණධර්මයි.

# පුද්ගලයෙකු තුළ වර්ධනය කළ යුතු සාරධර්ම

| ඉවසීම | |
|---|---|
| මිත්‍රශීලී බව | කාරුණික බව |

| අවංක බව | | |
|---|---|---|
| ත්‍යාගශීලී බව | | ක්‍රෝධ නොකිරීම |

| විනයගරුක බව | |
|---|---|
| නිහතමානී බව | දයාව |

- පුද්ගලයකු සාර්ථකත්වයට පත් වීමට පුද්ගලයා සතු සාරධර්ම වැදගත් වේ.
- පුද්ගල සංවර්ධනය උදෙසා මෙන්ම එදිනෙදා ජීවිතයේදී සාරධර්ම ජීවිතයට බද්ධ කර ගැනීම ඉතා වැදගත්ය

ඈත අතීතයේ සිටම සාරධර්ම පිළිපැදීමේ වැදගත්කම

සිරිත් මල්දම, සුභාෂිතය , ලෝකෝපකාරය ආදී පද්‍ය කෘතිවලින් ඉස්මතු කර ඇත

# සිරිත් මල්දම

| | |
|---|---|
| ඇනුම් පද | නොකියමි |
| බැනුම් කැත බස් | නොකියමි |
| නිකම් බස් | නොකියමි |
| තරම් පමණට වදන් | තෙපලමි |

මම ඇණුම් පද නො කියමි. නොබනිමි. නරක වචන නොකියමි. හිස් වචන නොකියමි. මම මගේ තරම දැන කථා කරමි.

# ලෝකෝපකාරය

*ඉසුරෙන් පිරිහුණත්*

*සුදන තම ගුණය අඩු නො කරත්*

*බිඳුනත් රන් බඳුන*

*ඇති බර අගය අඩු නොවන මෙනි*

යහපත් අය සැප සම්පත්තියෙන් පිරිහී ගියත් ඔවුන්ගේ ගුණ යහපත්කම් නම් පිරිහෙන්නේ නැත. රත්තරන් භාජනය බිඳුනත්, ඒ භාජනයේ ඇති බරත් අගයත් අඩු නොවන්නා මෙනි.

# සුභාෂිතය

තිරසර ගුණෙන් යුතු මහතෙකු හට පවර
සමුදුරු සියල් කිදලෙක තුඹසෙක සුනෙර
පුවතර මේ දඹදිව මළුවෙක සිය ගෙදොර
ඔහු කර නොවන සැපතක් එ බැවින් කවර

ස්ථිර සාර ගුණයෙන් යුත් උතුම් මහත්මයෙකු හට මහා සාගරය දිය කඩිත්තෙකි. මහමෙර තුඹසෙකි, සුප්‍රකට මේ ජම්බුද්වීපය තමාගේ ගේ දොරකඩ මිදුලය. ඒ නිසා ඔහුගේ අතට පත් නොවන සැපතක් කවරේද?

**සවියෙන් පෙරට අපි එකට**
***e* - ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
| --- | --- | --- | --- |
| 7 | පුරවැසි අධ්‍යාපනය | 3 | 03. අපේ සංස්කෘතිය<br>--- ඇගයීම--- |

**සැකසුම: ගයානි විජේමාන්න**
**බප/හො/ගල්පාත ක.වි**

1. සංස්කෘතිය යනු කුමක්ද?
2. සංස්කෘතික අංග මොනවාද?
3. සංස්කෘතික අනන්‍යතාව යනු කුමක්ද?
4. සෑම ආගමකටම අයත් කණ්ඩායම්වල පුද්ගලයින් වන්දනාමාන කරන ස්ථාන මොනවාද?
5. ආගම අනුව ලංකාවේ සිටින ජනපිරිස් නම් කරන්න
6. විවිධ ආගම් හා ජනවර්ගවලට ආවේනික ලක්ෂණ මොනවාද?
7. සංස්කෘතික දායාද යනු කුමක්ද? සංස්කෘතික දායාද ලෙස ඔබ දකින ස්ථාන 2ක් ලියා දක්වන්න
8. ඔබට පවුල මගින් පවරා දෙනු ලබන සංස්කෘතික අංග මොනවාද?
9. ජාතික අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත මොනවාද?
10. බහු සංස්කෘතික සමාජයක් යනු කුමක්ද?
11. වර්තමාන ජාතික කොඩිය නිර්මාණය කිරීමට කමිටුවක් පත් කළේ කවුරුන් විසින්ද? කවදාද?
12. වර්තමාන ජාතික ගීතය රටේ ජාතික ගීය විය යුතු බව තීරණය කළේ කවදාද?
13. ශ්‍රී ලංකා ජනරජයේ ජාතික ගීය "ශ්‍රී ලංකා මාතා" ගීතය බව සඳහන් කර ඇත්තේ කුමකද?

14. රාජ්‍ය ලාංඡනයේ විශේෂත්වය කුමක්ද?

15. රාජ්‍ය ලාංඡනය යොදන අවස්ථා මොනවාද?

16. රාජ්‍ය ලාංඡනයේ භාවිත අයිතිය හිමි වන්නේ කාටද?

17.බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ අප රට භාවිත කරන ලද රාජ්‍ය ලාංඡනය කුමක්ද?

18. වර්තමාන රාජ්‍ය ලාංඡනය නිර්මාණය කර ඇත්තේ කවුද?

19. ශ්‍රීලංකාවේ ජාතික වෘක්ෂයේ උද්භිද විද්‍යාත්මක නාමය කුමක්ද?

20. ජාතික වෘක්ෂය ලෙස නා ගස තෝරා ගැනීමට බලපෑ සාධක මොනවාද?

21. මෙරට ජාතික පුෂ්පයේ උද්භිද විද්‍යාත්මක නාමය කුමක්ද?

22. බංගලාදේශයේ  ජාතික පුෂ්පය කුමක්ද?

23. ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා ලෙස වළි කුකුළා තෝරා ගැනීමට බලපෑ හේතු මොනවාද?

24. ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව ලෙද එල්ලේ ජාතික ක්‍රීඩාව ලෙස නොගැනීමට හේතුව කුමක්ද?

25. එල්ලේ අප රටට හඳුන්වා දුන්නේකවුද?

26. සංස්කෘතික අනන්‍යතාව යනු කුමක්ද?

27. පුද්ගලයෙකු තුළ වර්ධනය කළ යුතු සාරධර්ම මොනවාද?

28. සාරධර්ම පිළිපැදීමේ වැදගත්කම පෙන්වන පැරණි කාව්‍යයන් මොනවාද?

**සවියෙන් පෙරට අපි එකට**
***e* - ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | පුරවැසි අධ්‍යාපනය | 3 | 03. අපේ සංස්කෘතිය<br>--- පිළිතුරු--- |

**සැකසුම: ගයානි විජේමාන්න**
**බප/හො/ගල්පාත ක.වි**

1. සංස්කෘතිය යන්න සරලව, සමාජයක මිනිසුන්ගේ හැසිරීම, පුරුදු, සිරිත්විරිත්, ආකල්ප, ඇබ්බැහිවීම්, විශ්වාස ආදී සියල්ල ලෙස හැඳින්විය හැකිය.

2. ආගම, දැනුම, විශ්වාස හා ඇදහිලි, අධ්‍යාපනය, සිරිත් විරිත්, නීතිරීති හා සම්ප්‍රදායන්, කලා ශිල්ප, ආහාර පාන, ඇඳුම් පැළඳුම්, සාහිත්‍යය , භාෂාව

3. ජනවර්ගය, ආගම, භාෂාව, ජීවනෝපාය මාර්ග යන සාධක පදනම් කරගෙන සංස්කෘතියකින් තවත් සංස්කෘතියක් වෙන්ව හඳුනා ගැනීමට හැකි වීම සංස්කෘතික අනන්‍යතාව නම් වේ.
4. කතරගම දේවාලය, නල්ලූර් කෝවිල, මඩු පල්ලිය, ශ්‍රී පාදස්ථානය හා තලවිල ආනා දෙව්මැදුර
5. බෞද්ධ හින්දු ඉස්ලාම් ක්‍රිස්තියානි
6. විවාහ මංගල අවස්ථා, දරුවකුගේ ඉඳුල් කටගෑමේ උත්සවය, හිසකෙසි කැපීමේ චාරිත්‍රය
7. සෑම සංස්කෘතියකටම අයත් අංග සංස්කෘතික දායාද නම් වේ
   සීගිරිය, ශ්‍රී මහා බෝධිය, අවුකන බුදුපිළිමය, කතරගම දේවාලය, නල්ලූර් කෝවිල ආදී...
8.
   - සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය තුළ නැකතට ලිප ගිනි මෙලවීම
   - කිරි ඉතිරවීම
   - ගනුදෙනු කිරීම

9.

- ජාතික කොඩිය
- ජාතික ගීය
- රාජ්‍ය ලාංඡනය
- ජාතික වෘක්ෂය
- ජාතික පුෂ්පය
- ජාතික පක්ෂියා
- ජාතික ක්‍රීඩාව

10. එකම රටක් තුළ විවිධ වාර්ගික, ආගමික සහ භාෂාමය කණ්ඩායම් රාශියක් ජීවත් වන සමාජ ක්‍රමයකි

11. 1948 මාර්තු මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මහතා
12. 1951 නොවැම්බර් 22

13. 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන උපලේඛනයේ

14. රාජ්‍යයේ අයිතිය මෙන්ම අනන්‍යතාව සංකේතවත් කරන සංකේතය රාජ්‍ය ලාංඡනයයි

15.

- මුදල් නෝට්ටු
- අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ලිපි ශීර්ෂ
- විදේශ ගමන් බලපත්‍ර
- ජාතික හැඳුනුම්පත

16. රාජ්‍ය ලාංඡනයේ භාවිත අයිතිය හිමි වන්නේ ජනාධිපතිවරයාටය

17. බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ අප රට භාවිත කරන ලද්දේ සිංහයා සහ කගවේනා සහිත බ්‍රිතාන්‍යය ලාංඡනයයි

18. වර්තමාන රාජ්‍ය ලාංඡනය නිර්මාණය කර ඇත්තේ එස්.එම්. සෙනවිරත්න මහතාය

19. මෙසුවා නාගස් ආරියම්

20.

- ශ්‍රී ලංකාවට උරුම ශාකයක් වීම(ඒක දේශීය)
- එහි ඇති ප්‍රයෝජනවත් බව
- ඓතිහාසික හා සංස්කෘතික වැදගත්කම
- අලංකාරවත් හා පියකරු බව
- ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්තව තිබීම
- පහතරට තෙත් කලාපයේ මෙන්ම වියළි කලාපයෙහිද බහුලව වැවෙන මෙය පන්සල් හා දේවාල ආශ්‍රිතව සුලභව දැකිය හැකිය. එසේම මග දෙපස සෙවණ සඳහාද නා ගස් රෝපණය කර ඇත
- වෙනත් රටක රාජ්‍ය ලාංඡනයක් ලෙස භාවිත නොකිරීම
- පූජනීයත්වයෙන් සැලකීම උදා: මංගල, සුමන, රේවත හා සෝභිත යන බුදුවරු නා සෙවණෙහි බුද්ධත්වය ලබා ඇත
- මතු බුදු වන මෛත්‍රීය බෝසතුන් නා ගසක් මුල බුද්ධත්වයට පත් වන බවට බෞධයන් විශ්වාස කරයි
- ගෞතම බුදුන් වහන්සේගේ පළමු ලංකා ගමනයේදී මහියංගනයේ නා පැළයක් රෝපනය කළ බවට විශ්වාස කරයි

21. නිම්පියා ස්ටෙලාටා

22. නෙළුම් මලයි

23. සත්ත්වයා  හා ලාංකික ගැමි ජන ජීවිතය හා බැඳුනු සමීප සම්බන්ධතාව, වළි කුකුළාගේ කඩිසර බව හ බාහිර පෙනුම, ශ්‍රී ලංකාවට ආවේණික වීම

24. එය ජාත්‍යන්තර ක්‍රීඩා තරග සඳහා යොදා ගැනීමට තිබූ දුෂ්කරතාවය නිසාය

25. 1916 දී ඇමරිකානු ජාතික රොබට් වෝල්ටර් මහතාය

26. කිසියම් ජන වර්ගයකට , ආගමික කණ්ඩායමකට , ජන සමූහයකට පාරම්පරිකව උරුම වී ඇති සංස්කෘතික අංග තම සංස්කෘතික අනන්‍යතාව නම් වේ

27.

- විනයගරුක බව
- අවංක බව
- ඉවසීම
- නිහතමානී බව
- ත්‍යාගශීලී බව
- මිත්‍රශීලී බව
- කාරුණික බව
- ක්‍රෝධ නොකිරීම
- දයාව

28. සිරිත් මල්දම, සුභාෂිතය, ලෝකෝපකාරය